## ඓතිහාසික අධ්‍යයනයන්හි නව ක්ෂිතිජයක්

ඓතිහාසික දැනුම මිනිස් ජීවිතයේ නොවැළැක්විය හැකි අංගයක් බවට පත්ව ඇත. නූතන ශිෂ්ටාචාරය තුළ මෙය පැහැදිලිවම දක්නට හැකිය. ඓතිහාසික සවිඥානකත්වය නූතන අනන්‍යතා හැඩගැස්වීමෙහිලා දිගින් දිගටම තීරණාත්මක කාර්යයක් ඉටුකරයි. අපට මෙහිදී යොහාන් හවුසින්ඛා නම් ප්‍රකට ඉතිහාසඥයාගේ **"ඉතිහාසය යනු කිසියම් සංස්කෘතියක් සිය අතීතය පිළිබඳව සවිඥානකවන ආකෘතියයි "**යන අදහස තරමක් වෙනස් කොට, ඉතිහාසය යනු කිසියම් සංස්කෘතියක් සිය අතීතය මෙන්ම වර්තමානය පිළිබඳවද සවිඥානකවන, එමෙන්ම සිය අනාගතය පරිකල්පනය කරන්නාවූ ද ආකෘතියක් ලෙස හැඳින්වීමට පුළුවන. මේනිසා ඉතිහාසය ඉගැන්වීම හා ඉගෙන ගැනීම එදිනෙදා ජීවිතයට බෙහෙවින් අදාල වේ. විශේෂිත දැනුම් ශාඛාවක් ලෙස ගත් කල්හි පසුගිය දශක කිහිපය තුළදී විධිමත් ලෙස ඉතිහාස අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් විශාල වර්ධනයක් සිදුවී ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශයේ කාර්යභාරය වන්නේ මෙම නව දැනුම අත්පත්කර ගැනීම හා එම දැනුම ඓතිහාසික ගවේෂණයේදී ප්‍රායෝගික ලෙස යොදා ගැනීමයි. එමෙන්ම ඉතිහාස අධ්‍යයනයේ මෙම නව ප්‍රවණතා පාසැල්වල ඉතිහාසය උගන්වන ගුරුවරුන් හා ඓතිහාසික ගැටලු සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පිරිස් වෙත ගෙන යාමටද අප අධ්‍යයනාංශය සිය උපරිම උත්සාහය දරයි.

ඉතිහාසය අධ්‍යයනාංශය,
ශාස්ත්‍ර පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය.

# ඉතිහාසය සහතිකපත්‍ර පාඨමාලාව 2017

සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ ගුරුභවතුන් සඳහා ශ්‍රී ලංකා ඉතිහාසය ඉගැන්වීමට නව දිශානතියක්



කොළඹ විශ්ව විද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශය විසින් හඳුන්වා දෙන නව පාඨමාලාවකි.




*ශ්‍රී ලංකාවේ හා ලෝකයේ ඉතිහාසය*
*අභියෝගාත්මකව හා නව ප්‍රවේශයක්*
*ඔස්සේ තේරුම් ගැනීම*

## ඉතිහාසය අධ්‍යයනාංශය

## කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය අධ්‍යයනාංශයේ ආචාර්යවරුන් විසින් කරන ලද පර්යේෂණ ශ්‍රී ලංකාව හා ලෝක ඉතිහාසය පිළිබඳව ශාස්ත්‍රීය ඉතිහාස කතිකාවත පුළුල් කිරීමට හේතු වී ඇත.විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සිදුකර ඇති පර්යේෂණ විද්‍යාර්ථ පමණක් නොව ස්වකීය විෂය පිළිබඳ උනන්දුවක් ඇති ශාස්ත්‍රඥයින්ටද අත්වැලක් වී ඇත.

## අධ්‍යයනාංශයේ ඉලක්ක

- ඉතිහාස විෂයට අදාළ අන්තර් ශික්ෂණාත්මක ප්‍රවේශයන් ඇති කිරීම.
- ශ්‍රී ලංකාව හා ලෝක ඉතිහාසය සම්බන්ධ ගැටලු, විවාද හා තේමාවන් ගවේෂණය කිරීම.
- ඉතිහාසයේ නව ප්‍රවණතාවයන් හඳුනාගැනීම ,ඇගයීම හා විග්‍රහ කිරීම.
- නිර්මාණාත්මකව සහ විවේචනාත්මකව සංජානනය කිරීම.

## ඇතුළත් වීමේ අවම සුදුසුකම්

- අ .පො.ස උසස් පෙළ විභාගය විෂයන් තුනකින් සමත් වීම.

## පාඨමාලාව පිළිබඳ විස්තර

| | | |
|---|---|---|
| **කාලසීමාව** | : | මාස හයකි |
| **පැවැත්වෙන දිනය** | : | සෙනසුරාදා |
| **පාඨමාලා ගාස්තු** | : | රු.20,000/- |
| **මාධ්‍යය** | : | සිංහල සහ ඉංග්‍රීසි |
| **ආරම්භය** | : | 2017 ජූලි |

## අයදුම් කිරීම

අයදුම්පත්‍ර ලබාගැනීම සඳහා රු.1000/= ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක කොළඹ විශ්වවිද්‍යාලයේ **304140300003** යන ගිණුම් අංකයට බැර කළ යුතුය. එම ගෙවීම් වවුචර්පත සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ ඉතිහාසය අධ්‍යනාංශය, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, අංක 94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 යන ලිපිනයට ඉදිරිපත් කර අයදුම්පත ලබාගත හැකිය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2017 ජූනි මස** 12 වෙනි දින හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට පෞද්ගලිකව හෝ ලියාපදිංචි තැපැලෙන් එවිය හැකිය.

## පාඨමාලාවේ අරමුණු

- ඉතිහාසය හා සම්බන්ධ විවිධාකාරවූ ප්‍රවේශ පිළිබඳ අවබෝධය ලබාදීම.
- ඉතිහාසය ඉගැන්වීමේ නව ක්‍රම හඳුන්වාදීම.
- ශ්‍රී ලංකාව, දකුණු ආසියාව හා ලෝක ඉතිහාසයට අදාළ මෑතකාලීන පර්යේෂණ හඳුන්වා දීම.

## පාඨමාලා ඒකක

- ✓ ඉතිහාසයට හැඳින්වීමක්
- ✓ සම්භාව්‍ය ශිෂ්ටාචාර
- ✓ ශ්‍රී ලංකා ඉතිහාසයේ පවතින ගැටලු හා විවාද
- ✓ ලෝක ඉතිහාසයේ ගැටලු

## වැඩි විස්තර සඳහා අමතන්න

ආචාර්ය නිර්මලී විජේගුණවර්ධන,
අංශාධිපති,
ඉතිහාසය අධ්‍යයනාංශය,
ශාස්ත්‍ර පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය.
011 -2055658
http://arts.cmb.ac.lk/history/
ඊ-මේල් ලිපිනය: cch@history.cmb.ac.lk